# 10 සවනිගේ දිනපොතෙන්

## මාර්තු 02 සෙනසුරාදා



කතන්දර පොතක් කියවන්න ගත්තා. පිටුවෙන් පිටුව කියවන්න ආසයි. ඊළඟට මොකක් වෙයිද කියලා හිතාගන්නත් බැහැ. පොත එක හුස්මට කියෙව්වා. කතාව හරි ලස්සනයි. ඒ පොතේ නම 'කුඩා හොරා'. මා කියවූ පොත් ලැයිස්තුවට මේ කතන්දර පොතේ නමත් ලියා ගත්තා.

## මාර්තු 03 ඉරිදා



ගෙදර වැඩට රචනාවක් ලියන්න වුණා. 'කුරුලු ලෝකය' ගැන. හොඳ ම රචනාව බිත්ති පුවත්පතට තෝරා ගන්නවා කිව්වා. මම පිරිසිදුවට පැහැදිලි අකුරින් රචනාව ලිව්වා. අකුරක් නෑර ආයෙත් කියෙව්වා. වැරැද්දක් තිබුණේ නැහැ. හෙට ඉස්කෝලෙට ගෙනියනවා.



## මාර්තු 04 සඳුදා

බිත්ති පුවත්පතට තේරුණේ මගේ රචනාව තමයි. මගේ හිතේ මලක් පිපුණා වගේ. ගෙදර ගියේ ඒ ගැන අම්මාට කියන්න. මාමාත් අපේ ගෙදර ඇවිත් හිටියා. දෙන්නාට ම මම රචනාව ගැන කිවුවා. ඒ අයත් සතුටු වුණා.

## මාර්තු 05 අඟහරුවාදා



ඉස්කෝලෙ ඇරිලා ගෙදර එද්දි ළමයෙකුට කෙසෙල් ලෙල්ලක් පෑගුණා. ළමයා ලිස්සලා වැටෙන්න ගිහින් අනූනවයෙන් බේරුණේ.

පාරේ කෙසෙල් ලෙලි දාන්න හොඳ නැති බව ගුරුතුමිය දවසක් කිවුවා. මට ඒ වෙලාවේ ඒක මතක් වුණා. මම ඉක්මනට දුවලා ගිහින් ඒ කෙසෙල් ලෙල්ල ළඟ තිබුණු කසළ බඳුනට දැම්මා.

ගෙදර ඇවිත් මම ඒ සිද්ධිය චිත්‍රයට නැඟුවා. මාමාට පෙන්නුවා. පාට කරලා පත්තරේට යවමු කියලා මාමා කිවුවා. මට හරි සතුටුයි. මම චිත්‍රය පාට කළා.

## මාර්තු 06 බදාදා

ගස්මල් අඹරමින් හුළඟ හැමුවා. අහස අඳුරු වුණා. එකපාරට ම හයියෙන් වැස්ස ගත්තා. විදුලි එළි අහසෙ විහිදුණා. මහ හඬින් ගෙරෙවුවා. එළියට බහින්නවත් බැහැ. මාමා ගමේ යන්න පාන්දරම සූදානම් වුණා. "මේ මොර සූරන වැස්සෙ කොහෙද යන්නෙ දූ" කියලා නැන්දා මාමාගෙන් ඇහුවා.

වැස්ස පෑවුණා ම මාමා ගමේ ගියා. මාත් ඉස්කෝලෙ ගියා.



## අවබෝධය

1. හිස්තැනට වඩාත් සුදුසු යෙදුම වරහන් තුළින් තෝරා ලියන්න.

(එක හුස්මට, අකුරක් නැර, ඉහේ මලක් පිපුණා, අනූ නවයෙන් බේරුණි, මොර සූරන වැස්සේ)

i. අයියා ළිඳ ළඟ වැටෙන්නට ගොස් ..................................

ii. ගුරුතුමිය ළමයින්ගේ රචනා ........................................ කියවූවා ය.

iii. බලු පැටියා කෝප්පයේ තිබූ කිරි ටික ............................ බිවුවේ ය.

iv. තාත්තා නංගිට බෝනික්කෙක් ගෙනාවේ ය. නංගිගේ ...................................................... වගේ පෙනුණි.

v. .......................................................... පැමිණි මාමා ගෙට ගොඩ වූයේ හොඳට ම තෙමී ගෙන ය.

## ක්‍රියාකාරකම 1

**පහත සඳහන් ඉඟි වැකි යොදා වාක්‍ය නිර්මාණය කරන්න.**

i. එක හුස්මට
ii. අකුරක් නැර
iii. ඉහේ මලක් පිපුණා
iv. අනූනවයෙන් බේරුණා
v. මොර සූරන වැස්ස

## ක්‍රියාකාරකම 2

**පුංචි ඔබත් ඔබේ එදිනෙදා ජීවිතයේ විශේෂ සිදුවීම් දිනපොතක ලිවීම අද සිට ආරම්භ කරන්න.**